මහව ප්‍රාදේශීය සභාව
කුරුණෑගල දිස්ත්‍රික්කය

**01. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 30 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 10 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 22 දිනද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මහව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්වාගණනය කළ මතය සඳහා පදනම**

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනයේ දක්වා ඇති රු. 441,353 ක් වූ අඹකොළවැව පෙරපාසල හා රු.1,143,391 ක් වූ වලලිය පුස්තකාල ගොඩනැගිල්ල ගිණුම්ගත කර නොතිබුණි. | වටිනාකම් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. | එම වටිනාකම් 2020 වර්ෂයට ගිණුම් ගත කරන බව දැනුම් දෙමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ වාහන කුලියට දීමෙන් ලැබිය යුතු රු.259,861 ක ශේෂය මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | හිඟ ශේෂ ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. | මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොමැති බව සඳහන් කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | සමාලෝචිත වර්ෂය අවසානයට ලී බඩු හා සවිකිරීම් උප ලේඛනයේ සඳහන් ළමා උද්‍යාන ලී බඩු සවිකිරීම් ප්‍රත්‍යාගණන වටිනාකම රු.1,312,500 ක් වුවද මූල්‍ය ප්‍රකාශන වල එය රු.3,112,500 ක් ලෙස දක්වා තිබුණි. | නිවැරදි වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. | මෙම වටිනාකම ඉදිරි ගිණුම් වලදී ගලපා නිවැරදි කිරීමට කටයුතු කරන බව සඳහන් කරමි. |
| (ඇ) | වටිනාකම රු. 17,363,032 ක් වූ ගිණුම් විෂයයන් 11 කට අදාළව අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන ලිඛිත සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. | විගණන අවස්ථාවේ පැවති වාතාවරණය අනුව මෙම ලේඛන විගණනයට ඉදිරිපත් කිරීමට නොහැකි විය. |

**1.4 අනුකූල නොවීම්**

------------------

**1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

------------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **අනුකූල නොවීම** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371(5) | අත්තිකාරම් පියවා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | උත්සව වියදම් සඳහා අදාළ අත්තිකාරම් මුදල ලබාගෙන වියදම් දරා ඇතත්, ඊට අදාළ අත්තිකාරම පියවීමේ කටයුතු සිදු නොකිරීම නිසා නොපියවූ ලෙස දැක්වෙතත්, ඒවා අදාළ කාර්යයට වැයකර ඇති බව සඳහන් කරමි. |

**1.5 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

-----------------------------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වසර ගණනාවක සිට මූල්‍ය ප්‍රකාශනවල පැවත එන භෞතිකව නොපැවති රු.541,322 ක් වූ බස්නැවතුම ඉදිකිරීමේ තොග විධිමත් අනුමැතියකින් තොරව සමුච්චිත අරමුදලට හර කර තිබුණි. | විධිමත් අනුමැතියකින් ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතු වේ. | වසර ගණනාවක සිට මූල්‍ය ප්‍රකාශනවල පැවතියත් භෞතිකව නොපැවති බස්නැවතුම්පල ඉදිකිරීමේ තොගය ව්‍යාජ වත්කමක් නිසා සභා අනුමැතියකින් ලේඛන වලින් ඉවත් කර ලේඛන යාවත්කාලීන කිරීමට කටයුතු කරන ලදී. |
| (ආ) | වසර ගණනාවක සිට පැවත එන රු.4,887,933 ක් වූ කර්මාන්ත ණයහිමි ශේෂයක්, නොපියවූ අත්තිකාරම් රු. 6,658,760 ක්, මධ්‍යම පරිසර අධිකාරිය නමින් වූ ණයගැති ශේෂය රු.761,854 ක් රු.4,434,019 ක් වූ කර්මාන්ත ණයගැති ශේෂයක් හා වරිපනම් ඒකක 16 ක් සඳහා වසර ගණනාවක බිල්කිරීම් ලෙස සඳහන් රු.245,724ක් වූ ශේෂය විධිමත් අනුමැතියකින් තොරව පොත් වලින් කපාහැර තිබුණි. | විධිමත් අනුමැතියක් සහිතව අවශ්‍ය නිවැරදි කිරීම සිදුකළ යුතු වේ. | විමසුමේ සඳහන්ව ඇති තොරතුරු දීර්ඝ කාලයක සිට පැවතෙන ණයහිමි, ණයගැති සහ අත්තිකාරම් ශේෂයන් වුවත්, ඒ සම්බන්ධව තොරතුරු සනාථ කරගැනීම සඳහා වන කිසිදු සාක්ෂියක් සභාවේ නොමැත. එම නිසා ලේඛන යාවත්කාලීන කිරීම සඳහා 2020.03.10 දින පැවති මහ සභාවේ තීරණ අංක 03 අනුව ලේඛනවලින් ඉවත් කිරීමට කටයුතු කළ බව සඳහන් කරමි. |

**02. මූල්‍ය සමාලෝචනය**

------------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,904,343 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 5,682,032 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

---------------------

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

--------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2019වර්ෂය ඇස්තමේන්තු ගතආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2018 වර්ෂය ඇස්තමේන්තු ගතආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| I. | වරිපනම් හා බදු | 5,379,712 | 5,853,348 | 6,110,870 | 3,760,225 | 5,804,712 | 5,641,448 | 4,601,969 | 4,017,748 |
| II. | බදු කුලී | 13,775,000 | 13,172,540 | 12,551,835 | 806,887 | 12,375,000 | 12,642,792 | 12,549,490 | 186,182 |
| III. | බලපත්‍ර ගාස්තු | 776,000 | 838,930 | 838,930 | - | 956,000 | 880,710 | 880,434 | - |
| IV. | වෙනත් ආදායම් | 95,669,395 | 82,464,940 | 96,674,282 | 16,744,013 | 106,272,000 | 76,439,539 | 62,259,370 | 30,958,355 |
| | එකතුව | 115,600,107 | 102,329,758 | 116,175,917 | 21,311,125 | 125,407,712 | 95,604,489 | 80,291,263 | 35,162,285 |

සටහන

----------

2018 හා 2019 වර්ෂවල රැස්කළ ආදායම අගය තුළ පසුගිය වර්ෂවලට අදාළ හිඟහිටි ලැබීම්ද ඇතුළත්ව තිබුණි. 2019 වර්ෂයේ රැස්කළ ආදායමින් රු.මිලියන 25.7 ක් ඉකුත් වර්ෂයට අදාළ ලැබීම් විය.

### 2.2.2 වරිපනම් හා බදු

-------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපාර ඒකක 216 කින් අයවිය යුතු රු.418,200ක් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152(4) ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පනතේ විධි විධාන අනුව අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ව්‍යාපාර බදු හා කර්මාන්ත බදු නොගෙවන්නන්ට එරෙහිව පනතේ 152(4) ප්‍රකාරව නීතියෙන් කටයුතු කිරීම ආරම්භ කර ඇති බව සඳහන් කරමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2012 වර්ෂයේ දේපළ තක්සේරු කිරීමෙන් අනතුරුව සිදුකළ නව ඉදිකිරීම් පරීක්ෂාකර, තක්සේරු වාර්තා ලබාගෙන වරිපනම් බදු අය කිරීමට කටයුතු කර නොතිබුණි. | නව ඉදිකිරීම් තක්සේරු කර ගාස්තු අය කිරීමට කටයුතු කළ යුතු වේ. | විගණනයෙන් ප්‍රකාශකර ඇති තත්ත්වය පිළිගනිමි. |

### 2.2.3 වෙනත් ආදායම්

-------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට පාරිභෝගිකයන් 176 ක ගෙන් රු.199,633 ක ජල ආදායම් ශේෂයක් අයවිය යුතුව පැවතුණි. | නියමිත කාලය තුළ ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | එම හිඟ අයකර ගැනීමට ඉදිරි පියවර ගන්නා බව සඳහන් කරමි. |

### 2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරින්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ ශේෂය රු.1,895,550 ක් විය. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අය කර ගැනීමට කටයුතු කරමි. |

## 03. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 3.1 කාර්යය සාධනය

-------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය , පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරිම පිළිබඳව අනාවරණය වූ නිරීක්ෂණයන් පහත දැක්වේ.

**කර්තව්‍යයන් ඉටු නොකිරීම**

-------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අයවැයගත රු. 8,600,000 ක් වූ කර්මාන්ත 04 ක් ඉටුකර නොතිබුණි. | අයවැයගත කර්මාන්ත ඉටු කිරීමට අවධානය යොමු කළ යුතු වේ. | ප්‍රමාණවත් තරම් මූල්‍ය ප්‍රතිපාදන සපයාගැනීමට නොහැකි වීමෙන් එම වැඩ විෂයයන් කල් දැමීමට සිදුවිය. එහෙත් අවශ්‍යතාව සලකා 2020 අයවැයට ඇතුළත් කර ඇති බව සඳහන් කරමි. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු ශේෂයෙන් වර්ෂයක් හා ඊට වැඩි කාලයක් ඉක්මවා ඇති එකතුව රු.6,269,982 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | සභාව වෙත ලැබිය යුතු හිඟ ආදායම් ඇතුළු ලැබිය යුතු මුදල් අයකර ගැනීම සඳහා ඉදිරියේදී වැඩපිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කරන බවත් සඳහන් කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂයක් හා ඊට වැඩි කාලයක් ඉක්මවා ඇති එකතුව රු.8,764,263 ක් වූ ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | වර්ෂයකට වඩා කල්ගතවී ඇති ණයහිමි ශේෂ මූල්‍ය තත්ත්වය අනුව පියවා දැමීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට රු.5,258,518 ක් වූ තැන්පත් මුදලින් ආපසු ගෙවිය හැකි තැන්පත් හඳුනාගෙන ආපසු ගෙවීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. | මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | විමසුමේ සඳහන් කර ඇති තැන්පත් වලින් ආපසු නොගෙවන ඒවා පමණක් ගණනය කර ආදායමට ගැනීමට කටයුතු කරන බව සඳහන් කරමි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

**(අ) සේවක පුරප්පාඩු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට අනුමත තනතුරුවල පුරප්පාඩු 22ක් පැවතුණි. | අත්‍යාවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පුරප්පාඩු සඳහා බඳවාගැනීමට අනුමැතිය ප්‍රධාන ලේකම්ගෙන් ඉල්ලා ඇත. අනුමැතිය ලැබූ පසු බඳවා ගැනීම් සිදුකළ හැකි බව සඳහන් කරමි. |

**(ආ) සේවක ණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට වැඩ තහනම් කිරීම, ස්ථාන මාරු වීම, මියයාම හා සේවය අතහැරයාම හේතුකොටගෙන නිලධාරීන් 10 ක ගෙන් රු.343,011 ක ණය ශේෂයක් අය වීමට පැවතුණි. | ණය අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ සේවක ණය අයකර ගැනීමට අප හැකි සෑම උත්සහයක්ම ගනිමින් සිටී. සමහර සේවකයින් සොයාගැනීමට ඇති ගැටළුව ආදී ප්‍රායෝගික ගැටළු නිසා මෙම කටයුත්ත ප්‍රමාදවී ඇති බව කාරුණිකව සඳහන් කරමි. |

## 3.4 වත්කම් කළමනාකරණය

-----------------------------

### 3.4.1 පවරා නොගත් වත්කම්

---------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව විසින් පරිහරණය කරනු ලබන රු.11,145,000 ක් වූ වාහන 07 ක් හා වටිනාකම් සඳහන් නොවූ ඉඩම් 45 ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | වාහන පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුවෙමින් ඇති අතර, පොදු ඉඩම් පවරා ගැනීමට ප්‍රාදේශීය ලේකම්ගෙන් ඉල්ලීම් කර ඇත. එම කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී. |

### 3.4.2 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

-----------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සභාව සතුව පවතින රු.362,500 ක් වූ වාහන 02 ක් වසර ගණනාවක සිට නිශ්ක්‍රීය තත්ත්වයේ පැවතුණි. | නිශ්ක්‍රීය වත්කම් අළුත්වැඩියා කිරීමට හෝ ඉවත් කිරීමට කටයුතු කළ යුතු වේ. | මෙහි සඳහන් වාහන අපහරණය සඳහා වයඹ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අපහරණ මණ්ඩලයට දන්වා ඇති බව සඳහන් කරමි. |
| (ආ) | බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මගින් ඉදිකර 2016 සැප්තැම්බර් 22 දින සභාවට ලබා දී තිබුණු මහව පොදු වෙළඳ සංකීර්ණයේ කඩ කාමරවල අඩුපාඩු සම්පූර්ණ කර 2019 දෙසැම්බර් 31 දින වන විටත් බදු දීමට කටයුතු නොකිරීම මත අවම වශයෙන් රු.2,583,000 ක කුලී ආදායමක් සභාවට අහිමි වී තිබුණි. | පවතින අඩුපාඩු සම්පූර්ණ කර සභාවේ ආදායම් උත්පාදන කටයුතු කඩිනමින් ඉටුකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | දැනට මෙම කඩකාමර සියල්ලට විදුලිය සපයා පවරාදී ඇති බව සඳහන් කරමි. |

**3.5 ප්‍රසම්පාදන**

**-------------**

**සැපයීම් හා සේවා**

**--------------------**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (අ) සභාවේ ආදාහනාගාරය සඳහා රු.151,900 ක් වටිනා විදුලි උත්පාදන යන්ත්‍රයක් මිලදී ගැනීම හා රු.99,650ක ටෝනර් මිලදී ගැනීම සඳහා වූ මිල කියුම් මිල කැඳවීමේ අවසන් දිනට පෙර විවෘත කර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මෙවන් අඩුපාඩු ඉදිරියේදී ඇති නොවන ආකාරයට කටයුතු කිරීමට පියවර ගන්නා බවත් අදාළ නිලධාරින්ද විෂය සම්බන්ධව දැනුවත් කිරීමට පියවර ගන්නා බවත් සඳහන් කරමි. |